# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1998 අගෝස්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 අගෝස්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

# 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 1998 අගෝස්තු මස 19 වැනි දින]

එල්. ඩී.—ඕ. 9/96.

**පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ව්‍යාපාරය කරගෙන යාම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විධිමත් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු 'නියමිත දිනය' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**2.** නියමිත දින සහ ඉන් පසුව, මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරයක් යටතේ හැර සහ එහි නියම හා කොන්දේසිවලට අනුකූලව මිස, කිසිම තැනැත්තකු විසින් පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතු ය :

පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ව්‍යාපාරය පවත්වා ගෙන යන තැනැත්තන් ලියාපදිංචි කිරීම.

එසේ වුවද, නියමිත දිනට පෙරාතුව පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය යම් තැනැත්තකු විසින්, ඒ දින සිට මාස හයක කාලයක් සඳහා එය එසේ නොකඩව පවත්වාගෙන යාහැකි අතර, එහෙත්, ඒ කාලය ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කළයුතු අතර මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගත යුතු ය.

**3.** (1) මේ පනතේ කාර්ය සඳහා, නමින් හෝ ධුරයෙන් —

නිසි බලධරයා පත් කිරීම.

(අ) නිසි බලධරයකු ; සහ

(ආ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී නිසි බලධරයාට සහාය වීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක්

පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන අවස්ථාවක, නිසි බලධරයා විසින්, මේ පනත මගින් තමා වෙත පැවරුණු බලතල සියල්ලම හෝ යම් බලයක්, දිස්ත්‍රික්කයක් සඳහා පත් කරන ලද දිසා

2—D 043246—5,900 (97/03)

ලේකම් වෙත පවරනු ලැබිය හැකි ය. එසේ වුවද, මේ වගන්තිය යටතේ තමා වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ දිසා ලේකම් විසින් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් නිසි බලධරයා වගකිව යුතු ය.

පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීම.

**4.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක් ම පෞද්ගලික ආරක්ෂක ව්‍යාපාරයක් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට අදහස් කරන තැනැත්තකු විසින් නියමිත ආකෘතියෙහි නිසි බලධරයා වෙත කරනු ලැබිය යුතු අතර, ඉල්ලීමෙහි ඇතුළත් විස්තර, ඉල්ලුම්කරුගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට වූ ප්‍රකාශයක් සමග එවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා නිසි බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ ඉල්ලීම සලකා බැලීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා සලකන තොරතුරු හෝ ලේඛන කිසිවක්, ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිසි බලධරයා වෙත සපයන ලද ඉල්ලීම සහ යම් තොරතුරක් හෝ ලේඛනයක් සලකා බැලීමෙන් පසුව, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පුහුණුව හා පහසුකම් ඉල්ලුම්කරු සතු බවට, ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීමෙන් ජාතියේ ආරක්ෂාවට හානියක් සිදුනොවන බවට සහ ඉල්ලුම්කරු හෝ ඉල්ලුම්කරුගේ කටයුතු කළමනාකරණය කරන තැනැත්තා චරිත දූෂණය පිළිබඳ වරදකට වරදකරු නොවී ඇති බවට තමා සෑහීමට පත් වෙතොත්, නිසි බලධරයා විසින් ඉල්ලුම්කරු ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

බලපත්‍ර නිකුත් කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු, ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක, නිසි බලධරයා විසින්, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ බලය ඒ තැනැත්තාට දෙමින් නියමිත ආකෘතියෙහි වූ බලපත්‍රයක් නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එබඳු සෑම බලපත්‍රයක් ම, වර්ෂ දෙකක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් (සේවා නියුක්තිය අවසන් කිරීමට, වැඩ කළ යුතු පැය ගණනට සහ බලපත්‍රයක් දරන්නකු විසින් සේවයෙහි නියුක්ත කරන ලද පිරිස්වල වෙනත් සේවා කොන්දේසිවලට අදාළ කොන්දේසි ද ඇතුළුව) නියම කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ නිකුත් කරනු ලබන කිසිම බලපත්‍රයක්, වෙනත් යම් තැනැත්තකු වෙත නොපැවරිය යුතු අතර, ඒ අනුව, එවැනි යම් පැවරීමක් ශුන්‍ය හා බලරහිත විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම, ඒ බලපත්‍රය මගින් පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලය ලැබූ තැනැත්තාගේ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලයේ හෝ ස්ථානයේ සියලු අවස්ථාවන්හි දී ම ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

නිසි බලධරයා විසින් ලේඛනය පවත්වාගෙන යා යුතු බව.

6. මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සෑම තැනැත්තකු ම පිළිබඳව නියමිත ආකෘතියෙහි වූ ලේඛනයක් නිසි බලධරයා විසින් තබාගැනීම හා පවත්වාගෙන යාම, කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ බලපත්‍ර ලත් තැනැත්තා විසින් ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු ආකාරය.

7. (1) පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය කරගෙන යාම සඳහා තමා වෙත බලය දෙමින් මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු විසින්, තමා විසින් සපයන ලද සේවා ලබාගන්නා තැනැත්තන් සහ ඒ තැනැත්තන්ගේ දේපළ සුරැකෙන යම් ආකාරයකින්, ස්වකීය ව්‍යාපාරය සියලු අවස්ථාවන් හි දී ම පවත්වාගෙන යා යුතු ය.

(2) මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා විසින්, නියම කරනු ලැබිය හැකි යම් සටහන් පවත්වාගෙන යා යුතු අතර, යම් වාර වාර්තා ද නිසි බලධරයා වෙත සපයනු ලැබිය යුතු ය.

ව්‍යාපාරය අවසන්වීම පිළිබඳව නිසි බලධරයා වෙත දැන්වීම මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තා ගේ කාර්යය වන බව.

8. (1) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකු විසින්, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය කරගෙන යාම අවසන් කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ අවසන් කිරීම පිළිබඳව නිසි බලධරයා වෙත වහාම දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අවසන් කිරීම පිළිබඳ දැන්වීම ලැබුණු විට, 6 වන වගන්තිය යටතේ තමා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයෙන් ඒ තැනැත්තාගේ නම නිසි බලධරයා විසින් ඉවත් කරනු ලැබිය යුතු අතර, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය කරගෙන යාමට බලය දෙමින් ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකු පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන නොයන බව විශ්වාස කිරීමට තරම් නිසි බලධරයාට හේතු ඇති අවස්ථාවක, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය ඔහු විසින් අවසාන කර නොමැති බවට යම් දැන්වීමක දින සිට සති තුනක් තුළ හේතු ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කෙරෙන දැන්වීමක්, ලියාපදිංචි තැපෑලෙන් නිසි බලධරයා විසින් යවනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ දැන්වීමක් ලැබූ තැනැත්තා විසින්, දැන්වීමෙහි සඳහන් ඒ කාලය ඇතුළත දැන්වීමෙන් නියමිත හේතු ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අවස්ථාවක, 6 වන වගන්තිය යටතේ තමා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයෙන් ඒ තැනැත්තාගේ නම ඉවත් කර පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා ඒ තැනැත්තා වෙත බලය දෙමින් ඔහු වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

(4) නිසි බලධරයා විසින් ලේඛනයෙන් නම ඉවත් කරන ලද තැනැත්තා වෙත එසේ නම ඉවත් කිරීම සහ (3) වන උපවගන්තියේ ප්‍රකාර බලපත්‍රය අවලංගු කිරීම පිළිබඳව ලියවිල්ලක් මගින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමෙහි විස්තරවල යම් වෙනසක් නිසි බලධරයා වෙත දැනුම් දිය යුතු බව.

9. මේ පනත යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් දරන්නකු විසින් ම, මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ තම ඉල්ලීමෙහි ඇතුළත් විස්තරවල යම් වෙනසක් වෙතොත්, දින තිහක් ඇතුළත ඒ වෙනස පිළිබඳව ලියවිල්ලකින් නිසි බලධරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

බලපත්‍රය අලුත් කිරීම.

10. මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රය ඉකුත්වීමට පෙර ලිත් මාස තුනක් ඇතුළත නියමිත ආකෘතියෙහි වූ ඉල්ලීමක් මත නිසි බලධරයා විසින් අවුරුදු දෙකක කාලයක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

11. බලපත්‍රධරයා විසින් — බලපත්‍රයක් අවලංගු කිරීම.

(i) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ඒ බලපත්‍රයට යටත් යම් නියමයක් හෝ කොන්දේසියක් කඩකර ඇති බවට ;

(ii) තමා විසින් සපයන ලද සේවාවන් ලබාගත් තැනැත්තා ගේ හෝ තැනැත්තන්ගේ දේපළවල ආරක්ෂාවට අනර්ථදායක ආකාරයකින් ස්වකීය ව්‍යාපාරය පවත්වාගෙන ගිය බවට

බලපත්‍රධාරියා වෙත කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබාදීමෙන් පසුව, නිසි බලධරයා සෑහීමට පත්වන්නේ නම්, මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ අලුත් කරන ලද බලපත්‍රයක්, අවලංගු කිරීම හෝ අලුත්කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ නිසි බලධරයා විසින් කරනු ලැබිය හැකි ය.

12. (1) 4 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම නිසි බලධරයාගේ ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ අවලංගු කිරීමෙන් හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද්දා වූ හෝ අලුත්කරන ලද්දා වූ බලපත්‍රයක් අලුත්කිරීමට ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අලුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ තීරණය ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව අභියාචනය කරනු ලැබිය හැකි ය. ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම ආදියට එරෙහිව අභියාචන.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කරන ලද අභියාචනයක් මත ඔහු විසින් දෙන ලද තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට විරුද්ධව ලියවිල්ලකින් වූ ඉල්ලීමකින් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැකි අතර අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය. ඒ අභියාචන දෙකම පිළිබඳ කටයුතු මාස එකක කාලයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

13. මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් කලින් කල, නිසි බලධරයා වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලියවිල්ලක් මගින් නිකුත් කරනු ලැබිය හැකි අතර, නිසි බලධරයා විසින් ඒ විධාන බලාත්මක කරනු ලැබිය යුතු ය. විධාන.

ඇතුල්වීමේ බලතල.

**14.** මේ පනතේ විධිවිධානවලට හෝ යම් බලපත්‍රයක නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන බව නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු විසින්, පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානයකට හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් සැපයීමට බලය දෙන ලද සේවා කිසිවක් සපයනු ලබන යම් ස්ථානයකට හෝ කවර වූ හෝ විටෙක ඇතුල්වීමට, නිසි බලධරයාට හෝ නිසි බලධරයා විසින් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකුට හැකි ය.

බලපත්‍රයක් නොමැතිව පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම වරදක් බව.

**15.** මේ පනත යටතේ බලපත්‍රයක් නොලබා පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය පවත්වාගෙන යන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාවරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

විවිධ වැරදි.

**16.** (අ) මේ පනත යටතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන ;

(ආ) 4 වන වගන්තිය යටතේ යම් ප්‍රකාශයක හෝ ඉල්ලුම්පත්‍රයක හෝ තමා විසින් පවත්වාගෙන යන ලද යම් වාර්තාවක හෝ 7 වන වගන්තිය යටතේ සපයන ලද යම් වාර වාර්තාවක හෝ දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් කරන ;

(ඇ) 14 වන වගන්තිය මගින් නිසි බලධරයා වෙත පැවරුණු බලතල ඔහු විසින් ක්‍රියාත්මක කිරීමේ දී, නිසි බලධරයාට හෝ නිසි බලධරයා විසින් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකුට ප්‍රතිරෝධය පාන හෝ බාධා කරන ; හෝ

(ඈ) 14 වන වගන්තිය මගින් නිසි බලධරයා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමේ දී නිසි බලධරයාට හෝ නිසි බලධරයා විසින් ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකුට බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත්කරන

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක්

නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

**17.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක,— පුද්ගල මණ්ඩල විසින් සිදුකරන වැරදි.

(අ) ඒ මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂකවරයෙක් ම, වරදකට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, තමාගේ දැනීමක් නොමැතිව ඒ වරද සිදු කරන ලද බව හෝ ඒ වරද කිරීම වළක්වාලීමෙහි ලා ඔහු නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියාකර ඇති බව ඒ අධ්‍යක්ෂ හෝ හවුල්කරු විසින් ඔප්පු කළහොත්, ඔහු වරදකට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

**18.** (1) නියෝග සෑදිය යුතු කරුණු ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති කාරණ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන යම් කරුණක් හෝ කාරණා සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය :—

(අ) යම් සේවා මණ්ඩලයක් සම්බන්ධයෙන් ලබාගත යුතු ආරක්ෂණ නිෂ්කාශනය ද ඇතුළුව, ලියාපදිංචි පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන විසින් සේවා මණ්ඩලය තෝරා ගැනීමේ කාර්ය පරිපාටිය ;

(ආ) ඒ සේවා මණ්ඩලය සඳහා සැපයිය යුතු ආරම්භක පුහුණුව සහ සේවාස්ථ පුහුණුව ;

(ඇ) ඒ සේවා මණ්ඩලය විසින් ඇඳිය යුතු නිල ඇඳුම් ;

(ඈ) ඒ සේවා මණ්ඩලය විසින් සන්තකයේ තබාගත යුතු තුවක්කු භාවිතයෙහි ලා තිබිය යුතු ශක්‍යතා මට්ටම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් වන යම් පසු දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව, පහසුවෙන්ම හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, අනනුමතයේ දින පටන්, එහෙත්, ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කළ ලෙස සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සැක දුරු කිරීම.

**19.** මේ පනතේ විධිවිධාන රජය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**21.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයක් පිළිබඳ ව්‍යාපාරය" යන්නෙන්, රාජ්‍ය අංශයේ සේවයෙහි නියුක්ත තැනැත්තන් ද ඇතුළු තැනැත්තන් හෝ (රජයට අයත් දේපළ ද ඇතුළුව) දේපළ ආරක්ෂා කිරීම සඳහා ගෙවීම මත සේවා සැපයීමේ ව්‍යාපාරය අදහස් වේ.

"නිසි බලධරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා නිසි බලධරයා විය යුතු 3 වන වගන්තියේ ප්‍රකාර පත් කරන ලද තැනැත්තා අදහස් වේ.